# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2231/23 - 2021 ජුනි මස 11 වැනි සිකුරාදා - 2021.06.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

විධාන අංක : 79

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

10(1)(ආ)(ii) වගන්තිය යටතේ විශේෂ විධානය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 10(1)(ආ)(ii) වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව සහල් නිෂ්පාදකයෙකු, වී මෝල් හිමියෙකු, වී සහ/ හෝ සහල් රැස් කරන්නෙකු, ගබඩාකරුවෙකු, බෙදාහරින්නෙකු හෝ වී සහ/ හෝ සහල් තොග වෙළෙන්දෙකු විසින් තම සන්තකයෙහි, භාරයෙහි හෝ තම පාලනය යටතෙහි ඇති වී සහ/ හෝ සහල් ගුදම්, සයිලෝ, ගබඩා, බහාලුම් හෝ වෙනත් ස්ථාන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ ලියාපදිංචි කළ යුතු බවට මෙයින් විධාන කරනු ලැබේ.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ ලියාපදිංචියකින් තොරව කිසිදු සහල් නිෂ්පාදකයෙකු, වී මෝල් හිමියෙකු, වී සහ/ හෝ සහල් රැස්කරන්නෙකු, ගබඩාකරුවෙකු, බෙදාහරින්නෙකු, තොග වෙළෙන්දෙකු වී සහ/හෝ සහල් තම සන්තකයෙහි තබා නොගත යුතු අතර එම ගුදම්, සයිලෝ, ගබඩා, බහාලුම් හෝ වෙනත් ස්ථානවල තොග වශයෙන් හෝ අන්‍යාකාරයකින් රැස්කර ඇති වී සහ/ හෝ සහල් ප්‍රමාණයන් පිළිබඳ තොරතුරු ඉල්ලා සිටින විට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙත සැපයිය යුතු බවට ද මෙයින් තවදුරටත් විධාන කරනු ලැබේ.

මේ වන විට, සහල් තොග සන්තකයෙහි පවතින නිෂ්පාදකයෙකු, වී මෝල් හිමියෙකු, වී සහ/ හෝ සහල් රැස්කරන්නෙකු, ගබඩාකරුවෙකු, බෙදාහරින්නෙකු, තොග වෙළෙන්දෙකු මෙම විධානය නිකුත් කළ දින සිට දින 07ක් ඇතුළත පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියෙහි ලියාපදිංචි විය යුතු අතර ඔවුන් භාරයෙහි ඇති වී සහ/ හෝ සහල් තොග පිළිබඳ තොරතුරු පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙත ලබා දිය යුතු බවටද මෙයින් විධාන කරනු ලැබේ.

1A - PG 5412 — 225 (2021/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

වී වගාකරුවකු තම වගා කළ බිමෙන් ලබා ගත් වී අස්වැන්න ගබඩාකර තබා ගැනීම සම්බන්ධයෙන් මෙම විධානය බල නොපැවැත්වේ.

මෙම විධානය වර්ෂ 2021 ජුනි මස 11 වැනි දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

මේජර් ජෙනරාල් **ශාන්ත දිසානායක** (විශ්‍රාමික),
සභාපති.

2021 ජුනි මස 11 වැනි දින,
කොළඹ දී ය.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.